**EX/Rec/26/06**

# <u>නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයට අයත් ඒකාබද්ධ සේවයේ රියදුරු III ශ්‍රේණියට පළාත් කුසලතා පදනම මත බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2026</u>

නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයට අයත් ඒකාබද්ධ සේවයේ රියදුරු III ශ්‍රේණියට පළාත් කුසලතා පදනම මත බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති නැගෙනහිර පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් නැගෙනහිර පළාත් සභාවේ www.ep.gov.lk → Exams→Online Application ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කල හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2026.06.22** දින වේ. මාර්ගගත අයදුම්පත් භාරගැනීම 2026.05.26 වන දින පෙ.ව. 9.00ට විවෘත වන අතර 2026.06.22 වන දින ප.ව. 10.00ට අවසන් වේ. මෙම ලිඛිත විභාගය ඉල්ලුම්පත්‍ර භාර ගැනීම අවසන් කළ පසු හැකිතාක් ආසන්න දිනෙක, මෙම නිවේදනයේ සඳහන් නැගෙනහිර පළාතේ නගර හතරකදී නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පවත්වනු ලැබේ.

**2. බඳවා ගැනීම සඳහා වන කොන්දේසි :-**

i. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු අතර, අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව සේවා කොන්දේසි තීරණය කරනු ලැබේ.

ii. මෙම දැන්වීමට අනුව ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවන් වෙනුවෙන්, නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පවත්වනු ලබන, ලිඛිත තරග විභාගයෙන් සමත් වන අයදුම්කරුවන් වෘත්තීය පරීක්ෂණයට (Trade Test) කැඳවනු ලබයි. වෘත්තීය පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන්, ලිඛිත තරග විභාගයේදී සහ වෘත්තීය පරීක්ෂණයේදී ලබාගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල මත පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කර ගනිමින් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කොට, පවතින පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

iii. මෙම සේවය ස්ථානමාරුවලට යටත්වන සේවයකි. එබැවින් මෙම තනතුරට පත්වීම ලබන අය නැගෙනහිර පළාතේ කවර ප්‍රදේශයක වුවද සේවය කළ යුතුය. එමෙන්ම නැගෙනහිර පළාතේ අවුරුදු දහයක (10) අනිවාර්ය සේවා කාලයක් සම්පූර්ණ කළ යුතුවේ.

iv. ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් සපුරා ඇති දැනටමත් රාජ්‍ය/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ සේවා නියුක්ත වූවන් ඔවුනගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේම අයදුම්කරු මෙම තනතුර සඳහා තේරී පත්වුවහොත් ඒ සඳහා නිදහස් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා එකඟතාවය පළ කල යුතුය. මෙම තනතුර සඳහා නිදහස් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ එකඟතාවය නොමැතිව අයදුම්පත් යොමු කළ අයදුම්කරුවෙකු තෝරා ගත හොත් නව පත්වීමක් සේ සලකා කටයුතු කරනු ලැබේ.

**03. පොදු සුදුසුකම් ෴-**

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්කරු නැගෙනහිර පළාතේ ස්ථිර පදිංචි අයෙකු විය යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පූර්වාසන්න වසර හයක් (06) කාලය තුළ අඛණ්ඩ වසර තුනක (03) කාලයක් නැගෙනහිර පළාත තුළ ස්ථිර පදිංචිය සහිත විය යුතුය. (සම්මුඛ පරීක්ෂණයේ දී තම ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ඡන්ද හිමි නාම ලේඛනය ඉදිරිපත් කළ යුතුය.)

iii. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

iv. අවම උස අඩි 05 ක් විය යුතුය.

v. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

vi. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර මෙම නිවේදනයේ සඳහන් තනතුරට අදාල සියලු සුදුසුකම් අයදුම්කරු විසින් සපුරා තිබිය යුතුය.

vii. පූජ්‍ය පක්ෂය සහ කාන්තාවන් මෙම තනතුර සඳහා අයදුම් කිරීමෙන් වලකින ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

**04. වයස් සීමාව ඃ-**

අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුයි. **(දැනටමත් රාජ්‍ය/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සිටින නිලධාරීන්ට මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.)**

**05. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්**

**5.1 අධ්‍යාපන සුදුසුකම් ඃ-**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර(සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට (02) නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව ඇතුළුව අවම වශයෙන් සම්මාන (C) 02ක් සහිතව විෂයයන් 06කින් සමත් වී තිබිය යුතුය.

හෝ

(ආ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලැබූ තෘතියික හෝ තාක්ෂණික ආයතයකින් ලබාගත් 3 වන මට්ටමේ (NVQ Level 3) ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකයක් ලබා තිබීම.

**5.2 වෘත්තීය සුදුසුකම් ඃ-**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද B හා C වාහන කාණ්ඩ පැදවීම පිළිබඳ රියදුරු බලපත්‍රයක් ලබා තිබිය යුතුය. (පැරණි රියදුරු බලපත්‍රයෙහි C, $C_1$ සහ B වාහන කාණ්ඩ පැදවීම පිළිබඳ රියදුරු බලපත්‍රයක් ලබා තිබීම අවශ්‍ය වේ.)

**5.3 පළපුරුද්ද ඃ-**

රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු , වාහන රියදුරකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (සේවා සහතික මඟින් සනාථ කළ යුතුය.)

**5.4 ශාරීරික යෝග්‍යතාවය ඃ-**

සියලුම අයදුම්කරුවන් දිවා කාලයේ සහ රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමකින් යුක්ත විය යුතු අතර, යහපත් කායික මානසික යෝග්‍යතාවයකින් යුතු අයෙකු විය යුතුය. (සම්මුඛ පරීක්ෂණයේ දී රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් නිකුත් කරන ලද විධිමත් සහතිකයක් මඟින් ඒ බව සනාථ කළ යුතුය.)

**06. වැටුප ඃ-**

මෙම තනතුරට 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංකඃ 10/2025 අනුව **PL 3 - 2025** දරණ වැටුප් බණ්ඩය යටතේ රු. **42,780-10x490-10x540-10x590-12x630 - 66,540/-** වැටුප් පරිමාණයක් හිමි වේ. පත්වීමක් සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවෙකුට එම වැටුප හිමිවන්නේ 2027.01.01 දින සිට වන අතර පත්වීම ක්‍රියාත්මක වන දින සිට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවීම් සිදුකරනු ලැබේ.

**07. බඳවා ගැනීමේ ක්‍රමය ඃ-**

7.1 මෙම තනතුර සඳහා නැගෙනහිර පළාත් සභාව තුල අනුමත රියදුරු සේවයේ බඳවා ගැනීමේ පරිපාටියටද රජයේ චක්‍රලේඛවලට හා ඉහත 2 (ii.) හි සඳහන් විධිවිධානවලටද අනුකූලව බඳවා ගැනීම සිදුකරනු ලැබේ. එහිදී මෙම දැන්වීමෙහි සඳහන් සුදුසුකම් සියල්ල පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නොමැති බව සම්මුඛ පරීක්ෂණයේදී හෙළිවුවහොත් තනතුර සඳහා වන හිමිකම අවලංගු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමක් සිදුකරනු නොලැබේ.

7.2 පවත්නා පුරප්පාඩු වලින් 80% ක් විවෘත තරග විභාගයෙන් පුරවනු ලැබේ.

**08. විභාග ගාස්තු ඃ-**

විභාග ගාස්තුව රු.1000/- කි. මෙම මුදල අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ එදිනට පෙර ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත නමට නැගෙනහිර පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන ලදුපත මාර්ගගත (online)ක්‍රමයට අයදුම්පත් යොමු කිරීමේදී අදාළ ස්ථානයෙහි උඩුගත (upload) කළ යුතුය. ලදුපතෙහි මුල් පිටපත අයදුම්පතෙහි බාගත කරගන්නා ලද මෘදු පිටපත සමග එවිය යුතුය. කුමන හේතුවක් නිසාවත් ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මෙම ගාස්තුව වෙනත් විභාගයකට මාරු කිරීමටද ඉඩ දෙනු නොලැබේ. **එසේම මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.**

**09. විභාග කොන්දේසි ඃ-**

9.1 මාර්ගගත (online) විභාග අයදුම්පත **ඉංග්‍රීසි භාෂාවෙන්** සම්පූර්ණ කළ යුතුය. මෙම විභාග දැන්වීම මාර්ගගත (online) අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර කියවා මෙහි සඳහන් උපදෙස් අයදුම්පත පිරවීමේ දී තරයේ පිළිපැදිය යුතු වේ. අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාරගන්නා ලද බව/ භාරනොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට (E-mail) හෝ දැනුම් දෙනු ලැබේ.

9.2 මෙම දැන්වීමෙහි සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත ඉහත සඳහන් කර ඇති විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් මාර්ගගතව (online) නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

9.3 විභාගය පැවැත්වීමට ආසන්න දිනෙක අයදුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍ර සම්බන්ධව නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඒ බව සඳහන් කරමින් නිවේදනයක් අයදුම්කරුවන් වෙත කෙටි පණිවිඩයක් (SMS) මඟින් සහ විද්‍යුත් තැපැල් ලිපිනයට (E-mail) දැනුවත් කරනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම් 026 2228368 දරණ දුරකථන අංකයට ඇමතිය හැක.

**10. අයදුම්කිරීමේ ක්‍රමය ඃ-**

10.1 අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු, එය බාගත (Download) කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර ලදුපතෙහි මුල් පිටපත අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැලවෙන සේ අලවා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත, කන්නියා පාර, වරෝදය නගර්, ත්‍රිකුණාමලය** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලදුපතෙහි මුල් පිටපත අලවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගැනීම සුදුසුය.)

10.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **EX/Rec/26/06 , "නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයට අයත් ඒකාබද්ධ සේවයේ රියදුරු - III ශ්‍රේණියට පළාත් කුසලතා පදනම මත බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2026"** ලෙස සඳහන් කළ යුතුය.

**11. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම ඃ-**

අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් අසත්‍ය බව පෙනී ගියහොත් හෝ සැපයිය යුතු තොරතුරක් හිතාමතා සැපයීම පැහැර හැර ඇති බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවකදී ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට හෝ ඔහුට/ඇයට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පිළිවන.

## 12. අත්සන සහතික කිරීම ඃ-

අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ පාසල් ප්‍රධානියෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, තම කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීවරයා, සාමදාන විනිශ්චයකාරවරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු රු. 854,880.00 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික එකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරණ නිලධාරියකු, බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තනතුරක් දරණ අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය. **රාජ්‍ය/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන්** අයදුම්පත්‍රයේ ඇති අයදුම්කරුගේ අත්සන දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු/දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරියේ අත්සන් කොට, එම අත්සන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු/දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර එවිය යුතුය.

## 13. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව ඃ-

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත.
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය.

## 14. විභාගයට පෙනී සිටීම ඃ-

14.1 ප්‍රවේශ පත්‍රයක් ලද විභාග අපේක්ෂකයකු තම ප්‍රවේශ පත්‍රයෙහි සඳහන් විභාග මධ්‍යස්ථානයේදී පමණක් විභාගයට පෙනී සිටිය යුතුය.

14.2 සෑම විභාග අපේක්ෂකයකුම මාර්ගගතව (Online) යොමු කරන විභාග ප්‍රවේශ පත්‍රය A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත සිටින සේ මුද්‍රණය කර මෙම දැන්වීමේ **12** හි සඳහන් පරිදි ප්‍රවේශ පත්‍රයෙහි අත්සන සහතික කරවාගත යුතුය. අත්සන සහතික කරගැනීමකින් තොරව විභාගයට පෙනී සිටීමට කිසිදු අපේක්ෂකයකුට අවසර දෙනු නොලැබේ.

14.3 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට අපේක්ෂකයාට සිදුවනු ඇත.

14.4 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු අතර, නියමිත සුදුසුකම් සපුරා නොගෙන මෙම විභාගයට ඉදිරිපත් වීම වරදක් සේ සලකනු ලැබේ.

## 15. විභාග පරිපාටිය ඃ-

මෙම විභාගය ලිඛිත පරීක්ෂණය, වෘත්තීය පරීක්ෂණය (Trade Test) යන කොටස්වලින් සමන්විත වේ. ලිඛිත පරීක්ෂණය, ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වන අතර සිංහල හා දෙමළ මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

### 15.1 ලිඛිත විභාගය ඃ-

| ප්‍රශ්ණ පත්‍රය | මුළු ලකුණු | කාලය | සමත් ලකුණු |
|---|---|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය | 100 යි | පැය 01 යි | 40 % |
| සාමාන්‍ය දැනීම | 100 යි | පැය 01 යි | 40 % |

**අභියෝග්‍යතා පරීක්ෂණය ඃ-**

මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලබන්නේ අපේක්ෂකයන්ගේ තර්කානුකූල හැකියාව, විශ්ලේෂණ හැකියාව, තීරණ ගැනීමේ හැකියාව සහ ගණිතමය හැකියාවන් යනාදිය පරීක්ෂා කිරීම සඳහාය.

**සාමාන්‍ය දැනීම ඃ-**

මෙම ප්‍රශ්න පත්‍රයට දේශීය හා විදේශීය ප්‍රවාහන ක්‍රම, රියදුරන් සඳහා වන ආචාරධර්ම, මාර්ග සංඥා සහ මාර්ග නීති, ප්‍රවාහනය සම්බන්ධව දේශීය හා විදේශීය වශයෙන් නිකුත් කරනු ලබන මාර්ග සංඥා සහ මාර්ග නීති පිළිබඳ දැනුම, කාලීන වශයෙන් වැදගත්වන දේශීය හා විදේශීය දේශපාලන, සංස්කෘතික, සමාජ හා ක්‍රීඩා තොරතුරු පිළිබඳ සාමාන්‍ය දැනීම යනාදිය ඇතුලත් කෙරේ.

**සටහන** ඃ- බඳවා ගැනීමේ විභාගයේදී විභාගය සමත් ලෙස සැලකීම සඳහා සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම ලකුණු 40 කට වඩා ලබාගත යුතුය. එසේ වුවත් හුදෙක් එකී ලකුණු 40 ක් වන සමත්වීමේ ලකුණු සීමාව නිසාම පවත්නා පුරප්පාඩු ප්‍රමාණය පිරවීමට නොහැකි වන විටෙක නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ හා නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ එකගතාවය සහිතව එම ලකුණු ප්‍රමාණය කිසියම් ප්‍රමාණයකින් පහළට ගෙන ඒමට නැගෙනහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමාට බලය ඇත.

**15.2 වෘත්තීය පරීක්ෂණය (Trade Test) ඃ-**

| විෂයය | | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| වාහන ධාවනය හා මහා මාර්ග නීති | | | |
| (i) | රිය පැදවීමේ නිපුණත්වය | 50 | 50 |
| (ii) | මාර්ග සංඥා සහ මහා මාර්ග සංඥා පිළිබඳ අවධානයට ලක් කිරීම | 30 | |
| (iii) | පදිකයින්ගේ ආරක්ෂාව | 10 | |
| (iv) | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 10 | |
| එකතුව | | 100 | |

**16.** විභාගය පැවැත්වීම සඳහා යෝජිත ප්‍රධාන නගර හා එහි අංකයන් පහත සඳහන් වේ.

| නගරය | නගර අංකය |
|---|---|
| ත්‍රිකුණාමලය | 01 |
| මඩකලපුව | 02 |
| අම්පාර | 03 |
| කල්මුණේ | 04 |

**සැ.යු. යම් නගරයකට ඉල්ලුම් කළ අයදුම්කරුවන් ගණන ප්‍රමාණවත් නොවේ නම් අයදුම්පතෙහි සඳහන් නගරයට යාබද නගරයක් වෙත යොමු කරනු ලැබේ.**

17. සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් සඳහා වෙනත් දිනයකදී සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

18. තම සුදුසුකම් සනාථ කිරීමට අදාළ සියලු ලියකියවිලි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන දිනයේදීම ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේදී ඉල්ලා ඇති නමුත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන සහතික සම්බන්ධයෙන් පසුව සලකා බලනු නොලැබේ.

19. මෙම නිවේදනයෙහි සඳහන් විධිවිධානවල කිසියම් සංශෝධනයක් අවශ්‍ය වුවහොත් ඒ සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගන්නා තීරණය අවසාන තීරණය වේ. එමෙන්ම මෙම විභාගය යම් විශේෂ හේතුවක් මත නොපැවැත්වීමේ අවශ්‍යතාවයක් පැන නැගුනහොත් ඒ පිළිබඳව ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ. එසේම මෙම තනතුරෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණයෙන් පිරවීම, කොටසක් පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසාන තීරණය ගැනීමේ බලය නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් මත පත්කිරීම් බලධාරියා සතු වේ.

**ජේ. ලියාකත් අලි,**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත.
26.05.2026